# නිස්සාහි ග්‍රෙගරි තුමන්ගේ දේවධාර්මික චින්තනය

එම්. කේ. ආර්. එස්. ප්‍රනාන්දු[1]

මේ පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණ වන්නේ කපදෝසියානු සභා පියවරයකු වන නිස්සාහි ග්‍රෙගරි තුමන්ගේ දේවධාර්මික සංකල්පයන් අධ්‍යයනයට ලක් කරමින් විශේෂයෙන් ත්‍රිත්වය පිළිබඳ දුර්මත හමුවේ එතුමන් ප්‍රකට කළ දේවධාර්මික චින්තනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම ය. මෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුව නම් සාධාර්මික කිතුනු ධර්මයට එරෙහිව දුර්මත ඇති වූ යුගයක ග්‍රෙගරි තුමා ඊට ප්‍රතිචාර දැක්වූ අන්දම කුමක් ද යන්න යි. මේ ගැටලුව නිරාකරණය කිරීමේ දී තහවුරු වූයේ මෙතුමා සාම්ප්‍රදායික සභා පියවරුන්ගේ ඉගැන්වීම අනුව යමින් විශ්වාසය පිළිබඳ ගැඹුරු අත්හදා බැලීමක් සිදු කර ඇති බවත් සාධර්මික කිතුනු ධර්මය රැකගැනීම සඳහා ප්‍රබල දායකත්වයක් ලබා දී ඇති ආකාරයත් ය.

**ප්‍රමුක පදඃ** ත්‍රිත්වය, දුර්මත, දේවධර්මය, ග්‍රෙගරිතුමා, කිතුනු ධර්මය

---

[1] බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය